ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

# OCI (Overseas Citizens of India) කාඩ්පත් අලුත් කිරීම සඳහා අවසාන දිනය දීර්ඝ කෙරේ

තම OCI කාඩ්පත් අලුත් කිරීම සඳහා අයැදුම් කිරීමට අවශ්‍ය කෙරෙන OCI කාඩ්පත් හිමියන්ට 2020 දෙසැම්බර් 31 වන දක්වා අයැදුම් කළ හැකිය. පවත්නා නීති රීතීන්ට අනුව මුහුණේ ඇතිවන ජෛව විද්‍යාත්මක වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් වයස අවුරුදු 20ට අඩු OCI කාඩ්පත් හිමියන් නව ගමන් බලපත්‍රයක් ලබා ගන්නා සෑම අවස්ථාවකම හා වයස අවුරුදු 50ට වැඩි OCI කාඩ්පත් හිමියන් නව ගමන් බලපත්‍රයක් ලබා ගන්නා අවස්ථාවක තම OCI කාඩ්පත් අලුත් කිරීම අවශ්‍ය වෙ.

2. එසේම ඉන්දීය රජය විදේශයන්හි සිරව සිටින පහත කාණ්ඩයන්හි OCI කාඩ්පත් හිමියන්ට ඉන්දියාවට පැමිණීම සඳහා අවසර ලබා දීමට තීරණය කර ඇත.

I. විදේශයන්හි සිටින සහ OCI කාඩ්පත් හිමි ඉන්දීය ජාතිකයන්ට උපන් කුඩා දරුවන්
II. පවුලේ අයකුගේ මරණයක් වැනි පවුලේ හදිසි අවස්ථාවක් සඳහා ඉන්දියාවට යාමට අවශ්‍ය කෙරෙන OCI කාඩ්පත් හිමියන්
III. එක් අයකු OCI කාඩ්පත් හිමියකු සහ අනෙක් පුද්ගලයා ඉන්දියානු ජාතිකයකු වන සහ ඔවුන්ට ඉන්දියාවේ ස්ථිර නවාතැනක් ඇති යුවළ
IV. දෙමාපියන් ඉන්දියාවෙ ජීවත් වන OCI කාඩ්පත් හිමි විශ්ව විද්‍යාල සිසුන් (නෛතිකව බාල වයස්කරුවන් නොවන)

අනෙකුත් කාණ්ඩවල OCI කාඩ්පත් හිමියන්ට ඉන්දීය රජය විසින් ජාත්‍යන්තර ගුවන් ගමන් මත පනවා තිබෙන සීමා ඉවත් කළ පසුව සහ ඉන්දියාවට යාමට යාවජීව වීසා බලපත්‍රයක් ලෙස OCI කාඩ්පත යළි ප්‍රතිෂ්ඨාපනය කළ පසුව පළමු ඡේදයේ දක්වා ඇති පරිදි නව ගමන් බලපත්‍රයක් ලබා ගත් සහ OCI කාඩ්පත් අලුත් කළ OCI කාඩ්පත් හිමියන්ට ඔවුන්ගේ පවත්නා OCI කාඩ්පත අනුව ඉන්දියාවට පැමිණීමට අවසර හිමි වනු ඇත. කෙසේ වෙතත්, මෙය OCI කාඩ්පත් හිමියා තම OCI කාඩ්පත, OCI කාඩ්පතේ

තොරතුරු ඇතුළත් කර තිබෙන වර්තමාන ගමන් බලපත්‍රය , පැරණි ගමන් බලපත්‍රය සහිතව ගමන් කළ යුතු බවට වන කොන්දේසියට යටත් වේ.

කොළඹ

ශක වර්ෂ 1942 ජ්‍යෙෂ්ඨ 21

2020 ජූනි 11